තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය

**ඩබ්ලිව්. ඩබ්ලිව්. ගාමිණී වික්‍රමරත්න එ. නාගරික සංවර්ධන අධිකාරිය**

RTIC Appeal (**ලේඛනගත කාර්යපටිපාටිය**)/ **158** /**2018** (**2018.05.18** දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය)**,** රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** පියතිස්ස රණසිංහ

**අභියාචක** - ඩබ්ලිව්. ඩබ්ලිව්. ගාමිණී වික්‍රමරත්න
**නොතිසි ලත් පාර්ශවය** - අධ්‍යක්ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය

**පෙනීසිටීම**

මෙම අභියාචනය ලේඛනගත කාර්යපටිපාටිය ඔස්සේ සළකා බලන ලදි.

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2017.10.02 |
| තොරතුරු නිළධාරියා තීරණය ලබා දුන් දිනය | 2017.10.09<br>2017.11.10 |
| නම් කල නිළධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2017.10.30 |
| නම් කල නිළධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.01.15 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු**:

අභියාචක 2017.10.02 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

***එච්. දන්තනාරායන නොතාරිස් තැන විසින් 1992.01.30 දින ලියා සහතික කරන ලද අංක 18 දරන බදු ගිවිසුමේ දෙවන උපලේඛනයෙහි දැක්වෙන මු පි කෝ 6097 හි කැබලි අංක 01 දරන ඉඩමට අදාළ එවකට සිටි රජයේ ප්‍රධාන තක්සේරුකරුවන පී. චන්ද්‍රසෙගරන් මහතා විසින් 2012.09.26 දිනැතිව ලබා දී ඇති තක්සේරු වාර්තාවේ පිටපතක්.***

තොරතුරු නිලධාරියා 2017.11.10 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ ඉල්ලා ඇති වාර්තාව රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ අංක හා 2013.03.12 දිනැති ලිපිය මඟින් අවලංගු කර ඇති බැවින් අවලංගු කරන ලද තක්සේරු වාර්තාවක් මෙම අධිකාරියට නිකුත් කළ නොහැකි බවයි. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2017.10.30 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයා පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2018.01.15 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

2018.05.15 දිනැතිව වග උත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කර ලද ලිඛිත කරුණු කියාපෑමට අනුව, තක්සේරුව තීරණය කිරීමේ අභිමත බලය හිමි ප්‍රධාන තක්සේරුකරු විසින් විෂගත තක්සේරුව ඉදිරියට යොදා නොගන්නා ලෙස දැනුම් දී ඇති බැවින් හා එය නීත්‍යානුකූල ලේඛණයක් ලෙස පිළිගත නොහැකි බැවින් තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කර ඇත.
**නියෝගය:**
අභියාචනය පුද්ගලික වශයෙන් විභාග කිරීම සඳහා 2018.07.10 දිනට කල් තබන ලදි.

*****

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ **158** /**2018** (**2018.07.10** දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යයා පටිපාටිය)**,** රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයා පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** පියතිස්ස රණසිංහ

**අභියාචක** - ඩබ්ලිව්. ඩබ්ලිව්. ගාමිණී වික්‍රමරත්න
**නොතිසි ලත් පාර්ශවය** - අධ්‍යක්ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය

**පෙනීසිටීම**
අභියාචක - ඩබ්ලිව්. ඩබ්ලිව්. ගාමිණී වික්‍රමරත්න
පොදු අධිකාරිය - පැමිණ නොසිටින ලදි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

වග උත්තරකාර පාර්ශවය පෙනී නොසිටින ලදි. වග උත්තරකාර පාර්ශවයට අදාළ නොතීසිය හා ලිපිය දීපව්‍යාප්තව පැවති තැපැල් වර්ජනය හේතුවෙන් ප්‍රමාද වී ලැබුණු බව 2018.07.10 දින ෆැක්ස් පණිවිඩයක් මාර්ගයෙන් කොමිෂන් සභාවට දන්වා ඇත.

එසේම අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු ලැබුණු බව අභියාචකද කියා සිටී.

**නියෝගය:**
අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු හිමිව ඇති බැවින් අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කිරීමට නියෝග කර සිටිමු.

*****